## විදේශගත විශ්‍රාමිකයන් සඳහා ජීවිත සහතික ලබා ගැනීම - 2018

විදේශගත විශ්‍රාමිකයන් හට 2018 වර්ෂය සඳහා ජීවිත සහතික ලබා ගැනීම 2017.12.01 සිට 2018.03.31 දක්වා සිදුකරනු ලැබේ. එම කාලසීමාව තුළදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශය මඟින් හෝ විශ්‍රාමිකයා පදිංචි රටෙහි තානාපති කාර්යාල හරහා පමණක් තම ජීවිත සහතික ලබා දීමට විදේශගත විශ්‍රාමිකයින් කටයුතු කළ යුතුය.

02. ඒ සඳහා www.pensions.gov.lk වෙතින් "ජීවිත සහතිකය-2018" ආකෘති පත්‍රය බාගත(download) යුතුය. එම ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර තමා විසින් ම තානාපති කාර්යාල වෙත හෝ විදේශ විශ්‍රාම වැටුප් අංශය වෙත භාරදිය යුතු අතර වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කිරීම මඟින් අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

03. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ, විශ්‍රාම වැටුප්/ සහකාර අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්) / විදේශ දූත මණ්ඩල කාර්යාලයක බලයලත් නිලධාරීන් හෝ ශාඛා ප්‍රධානී (විදේශ විශ්‍රාම වැටුප්) සහතික කරනු ලබන ජීවිත සහතික පමණක් වලංගු ජීවිත සහතික වේ.

04. ඉතා වයස්ගත හා රෝගීබව මත තානාපති කාර්යාල වෙත යාමට නොහැකි විශ්‍රාමිකයන් සඳහා පමණක් තමාට ප්‍රතිකාර කරනු ලබන වෛද්‍යවරයා මඟින් සහතික කරන ලද ජීවිත සහතික තානාපති කාර්යාලය මඟින් ද සහතික කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය.

05. තානාපති කාර්යාල මඟින් ලබා ගන්නා ලද ජීවිත සහතික තානාපති කාර්යාල මඟින් විද්‍යුත් පරිලේඛණය කර application.pensions.gov.lk/foreign යොමුව භාවිත කර විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට සෘජුව ඇතුල් කළ යුතුය. එම ජීවිත සහතික විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කරන ලදුව පිළිගැනීම/ ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබේ.

06. විදේශ විශ්‍රාම වැටුප් අංශය සඳහා ජීවිත සහතික ලබාදෙන විදේශ විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික විශ්‍රාම වැටුප් අධක්ෂා ජනරාල්/ අධ්‍යක්ෂ, විශ්‍රාම වැටුප්/ සහකාර අධ්‍යක්ෂ(විදේශ විශ්‍රාම වැටුප්) හෝ ශාඛා ප්‍රධානී (විදේශ විශ්‍රාම වැටුප්) සහතික කිරීමෙන් අනතුරුව සෘජුවම දත්ත පද්ධතියට ඇතුළත් කරනු ලැබේ. දත්ත පද්ධතියට ඇතුළත් කළ ජීවිත සහතික හා අසම්පූර්ණ තොරතුරු මත ප්‍රතික්ෂේප වූ ජීවිත සහතික පිළිබඳ විශ්‍රාමිකයන් වෙත දැනුම්දීම 2018.04.01 දින සිට 2018.04.30 දක්වා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මඟින් සිදුකෙරේ.

07. වසර තුනකට අඩු කාල සීමාවක් සඳහා විදේශගත වන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිය විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයින් සිය ජීවිත සහතික තානාපති කාර්යාල හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දිය යුතුය.

08. 2018.03.31 දිනට ජීවිත සහතික ලබා නොදුන් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් 2018 මැයි මස සිට තාවකාලිකව නතර කිරීමට ක්‍රියා කරනු ලැබේ. එම කාලය තුළදී ජීවිත සහතික ලබාදුන් එහෙත් අසම්පූර්ණ තොරතුරු මත ප්‍රතික්ෂේප වූ ජීවිත සහතික ලබා දුන් විශ්‍රාමිකයන් සඳහා නැවත ජීවිත

සහතික ලබාදීමට සහන කාලයක් 2018.04.01 දින සිට 2018.04.30 දින දක්වා ලබාදේ. එම කාලය තුළදී ද ජීවිත සහතික ලබා නොදුන් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් මැයි මස සිට තාවකාලිකව නතර කිරීමට කටයුතු කරනු ලැබේ. එසේ ජීවිත සහතික ලබා නොදුන් විශ්‍රාමිකයන් වෙනුවෙන් හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව පසුව දැනුම් දෙනු ලැබේ.

09. විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විශ්‍රාමිකයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම මත පමණක් රඳාපවතින හෙයින් 2018 වර්ෂය සඳහා ජීවිත සහතික ලබාගැනීමේ ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට ඔබගෙන් ලැබෙන සහයෝගය අතිශයින් අගය කරමි.